# ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය
## වැව්ලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

මෙම ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලාංකිකයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. පරිපාලන නිලධාරි - JM 1.1 (II ශ්‍රේණිය) - ස්ථිර පදනම මත

**රැකියා විස්තරය** : ආයතනයේ මානව සම්පත් කළමනාකරණය, ප්‍රසම්පාදන, ප්‍රවාහන, නඩත්තු සහ නීතිමය කටයුතු ඇතුළු පොදු පරිපාලන කාර්යයන් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ දී සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) වෙත සහාය වීම.

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන් සඳහා**

මානව සම්පත් කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / රාජ්‍ය පරිපාලනය / රාජ්‍ය කළමනාකරණය / වාණිජ්‍යය යන ක්ෂේත්‍රයන්හි උපාධිය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ විෂයය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
2. අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) - MA I.I, II ශ්‍රේණියේ වසර පහක (05) සතුටුදායක සේවා පළපුරුද්ද

**වැටුප් පරිමාණය** : JM 1.1 - රු. 72.650-10x1,360-18x2,040 = 122,970/-
**(ආරම්භයේ දී රු. 65,633/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාවලට හිමිකම් කියනු ලැබේ)**

**වයස් සීමාව** : වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය** : ලිඛිත තරගකාරී විභාගයක් සහ / හෝ වෘත්තියවේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

### 02. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුර - MA 1.1 (III ශ්‍රේණිය) - ස්ථිර පදනම මත

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන් සඳහා**

අ.පො.ස. (සා.පෙළ) විභාගයේ එක් වරක දී සිංහල / දෙමළ භාෂාව, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයක් සමත්ව තිබීම

සහ

අ.පො.ස. (උ. පෙළ) විභාගයේදී විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී සිංහල / දෙමළ භෂාව, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයක් සමත්ව තිබීම

සහ

ප්‍රාථමික මට්ටම - ශිල්පීය, අර්ධ ශිල්පීය හෝ ශිල්පීය නොවන සේවා කාණ්ඩ යටතේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක සතුටුදායක සේවා පළපුරුද්ද.

**වැටුප් පරිමාණය** : MA 1.1 - රු. 46,220-10x540-7x630-4x890-20x1,190 = 83,390/-
**(ආරම්භයේ දී රු. 43,312/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාවලට හිමිකම් කියනු ලැබේ)**

**වයස් සීමාව** : වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය** : ලිඛිත තරගකාරී විභාගයක් සහ / හෝ වෘත්තියවේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

### 03. රියදුරු තනතුර - PL 3 (III ශ්‍රේණිය) - ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත (කොළඹ සහ බගවන්තලාව අවට්න් විශේෂයි)

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන් සඳහා**

දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විෂයයන් හයක් (06) සම්මාන සාමාර්ථ දෙකක් සහිතව සමත්වතිබීම සහ වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් තිබීම සහ එම බලපත්‍රය ලබා ගැනිමෙන් පසුව වාහන පැදවීම පිළිබඳ වසර තුනක (03) සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් තිබීම සහ එම බලපත්‍රය ලබා ගැනිමෙන් පසුව වාහන පැදවීම පිළිබඳ වසර තුනක (03) සේවා පළපුරුද්ද සහ ප්‍රාථමික මට්ටම - අර්ධ පුහුණු (PL2) හෝ නුපුහුණු (PL1) තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා පළපුරුද්ද

**වැටුප් පරිමාණය** : PL 3 - රු. [43,280-10x490-10x540-10x590-12x630 = 67,040/-]
**(ආරම්භයේ දී රු. 40,834/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාවලට හිමිකම් කියනු ලැබේ)**

**වයස් සීමාව** : වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය** : ප්‍රායෝගික පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

### 04. අරක්කැමි තනතුර - PL 2 (III ශ්‍රේණිය) - කොන්ත්‍රාත් පදනම මත

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන් සඳහා**

තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව් විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයකින් ආහාර පාන සකස් කිරීම හා පිළිගැන්වීම සම්බන්ධව ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම 2 ට වඩා නොඅඩු සහතිකය ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

**වැටුප් පරිමාණය** : PL 2 - රු. [42,300-10x490-10x540-10x590-12x630 = 66,060/-]
**(ආරම්භයේ දී රු. 40,008/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාවලට හිමිකම් කියනු ලැබේ)**

**වයස් සීමාව** : වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

### 05. නේවාසිකාගාර සහායක තනතුර - PL 1 (III ශ්‍රේණිය) - කොන්ත්‍රාත් පදනම මත

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන් සඳහා**

අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටීම ප්‍රමාණවත් වේ.

**වැටුප් පරිමාණය** : PL 1 - රු. [40,500-10x450-10x490-7x540-15x590 = 62,530/-]
**(ආරම්භයේ දී රු. 38,488/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාවලට හිමිකම් කියනු ලැබේ)**

**වයස් සීමාව** : වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

### 06. උද්‍යාන සහායක තනතුර - PL 1 (III ශ්‍රේණිය) - කොන්ත්‍රාත් පදනම මත

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන් සඳහා**

අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටීම ප්‍රමාණවත් වේ.

**වැටුප් පරිමාණය** : PL 1 - රු. [40,500-10x450-10x490-7x540-15x590 - 62,530/-]
**(ආරම්භයේ දී රු. 38,488/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාවලට හිමිකම් කියනු ලැබේ)**

**වයස් සීමාව** : වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු**

උක්ත තනතුරු සඳහා තේරී පත්වන අයදුම්කරුවන් අදාළ රාජකාරී කටයුතු නිසි ලෙස ඉටු කිරීම සඳහා කායිකව මෙන්ම මානසිකව ද යෝග්‍ය විය යුතු අතර, සේවා අවශ්‍යතාව මත ප්‍රධාන කාර්යාලයේ හෝ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරී කටයුතු සිදු කිරීමට බැඳී සිටිය යුතුය.

**අයදුම්කරන පිළිවෙළ**

ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිත ඔබගේ සම්පූර්ණ ජීව දත්ත සටහන, අදාළ සහතිකවල පිටපත් සහිතව ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට 2026 ජූනි 30 වන දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් අදාළ ආයතනයේ ප්‍රධානීන් මගින් යොමු කළ යුතු වේ. **අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.** අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිනම් තත්ත්වයක් යටතේ වුවද භාරගනු නොලැබේ.

**සැළකිය යුතුයි**

- සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත තරගකාරී විභාග / සම්මුඛ පරීක්ෂණ සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබනු ඇත.
- මෙම දැන්වීම www.nipm.gov.lk යන වෙබ් අඩවියේද පළකොට ඇත.

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී,**
**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය,**
**එම්.ඩී.එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය.**
**දුරකථනය : 011-2770232**